## 'ප්‍රාථමික - ශිල්පීය නොවන' සේවා ගණය සඳහා දෛනික පදනම මත සේවකයින් ලියාපදිංචි කර ගැනීම

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පැවතීම හේතුවෙන් සේවා අවශ්‍යතාවය සඳහා දෛනික පදනම මත ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- **වැඩ/ක්ෂේත්‍ර කම්කරු - තනතුරු 06** - මෙම තනතුරට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරාලිය යුතුය. 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වීම.
- **මුරකරු- තනතුරු 01** - මෙම තනතුරට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරාලිය යුතුය.

  අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය.

උක්ත තනතුරු සඳහා අනෙකුත් සුදුසුකම් පහත පරිදි විය යුතුය.

**කායික සුදුසුකම්** : දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**වෙනත් සුදුසුකම්** :

1) ශ්‍රී ලංකා පුරවැසියකු වීම.
2) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
3) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.
4) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**වයස** : අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 45

**බඳවා ගැනීමේ ක්‍රමය** :

(1) මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යවහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරේ. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

(2) මෙය 2025.12.31 දිනය දක්වා පමණක් සේවය ලබා ගැනීම සඳහා පමණක් වීම.

(3) රා.ප.ච. 10/2025 අනුව PL 1 තනතුරට අදාළව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගැනීම.

**අයදුම්පත් එවිය යුතු ආකාරය** : මේ සමග සඳහන් කර ඇති අයදුම්පත අනුව ඔබ විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කර සකස් කර ගත් අයදුම්පත් 2025 අගෝස්තු මස 20 දිනට ප්‍රථම ලියාපදිංචි තැපැල මගින් ලිපි කවරයේ වම් පස ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

**අයදුම්පත සමග එවිය යුතු ලේඛන** : උප්පැන්න සහතිකයේ පිටපතක්/ ජාතික හැඳුණුම්පතෙහි පිටපතක්/ අධ්‍යාපන සහතිකවල පිටපත්/පදිංචි සහතිකයේ පිටපතක්

සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

රුවන් වික්‍රමආරච්චි,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දිනය : 2025.08.05 දින.

(ආදර්ශ අයදුම්පත)

**.................................................................... තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම : ....................................................................

02. මුලකුරු සමග නම : ....................................................................

03. ජාතිය : ....................................................................

04. ආගම : ....................................................................

05. පුද්ගලික ලිපිනය : ....................................................................

06. දුරකතන අංකය : ....................................................................

07. උපන් දිනය : ....................................................................

08. ජාතික හැඳුණුම්පත් අංකය : ....................................................................

09. අධ්‍යාපන සුදුසුකම් : ....................................................................

....................................................................

....................................................................

....................................................................

10. වෙනත් සුදුසුකම් : ....................................................................

11. පළපුරුද්ද : ....................................................................

මා විසින් මා විසින් සඳහන් කරන ලද සත්‍ය හා නිවැරදි බවටත්, සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර නොමැති බවටත් සහතික කරමි.

දිනය : 202.................... ...................................................

අයදුම්කරුගේ අත්සන.